

**9.**

*(a)* අනාගතයේ දී ශ්‍රී ලංකාවේ රසායනික කර්මාන්තයක් ස්ථාපිත කිරීමට අවසන් වසරේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකු විසින් අඳින ලද ගැලීම් සටහන පහත දැක්වේ.

ස්වභාවික අමුද්‍රව්‍යයන්, නිෂ්පාදන ක්‍රියාවලි සහ ඵල නිරූපණය කිරීමට පහත දැක්වෙන සංකේත භාවිත කෙරේ.




$P_2$ කාමර උෂ්ණත්වයේ දී ද්‍රවයක් ලෙස පවතින හැලජනයක් නිපදවීම සඳහා භාවිතා කරයි.

$P_7$ විරංජකයක් /ප්‍රබල ඔක්සිකාරකයක් ලෙස භාවිත වේ.

$P_8$ යහපත් සෞඛ්‍යයක් පවත්වා ගැනීම සඳහා දිනපතා භාවිත වේ.

(i) $\mathbf{R_1}$ සහ $\mathbf{R_2}$ ස්වභාවික අමුද්‍රව්‍යයන් **දෙක** හඳුනාගන්න.

(ii) $\mathbf{M_1, M_2, M_3, M_4}$ නිෂ්පාදන ක්‍රියාවලිය **හතර** හඳුනාගන්න. [උදා **:** ඇමෝනියා නිෂ්පාදනය හෝ හේබර් ක්‍රමය]

(iii) $\mathbf{P_1}$ සිට $\mathbf{P_9}$ දක්වා ඵල හඳුනාගන්න.

(iv) $\mathbf{M_1}$ සිට $\mathbf{M_3}$ ක්‍රියාවලියන්හි පියවර කෙටියෙන් විස්තර කරන්න. (උපකරණවල රූපසටහන් අවශ්‍ය නොවේ)

(v) $\mathbf{M_2}$ ක්‍රියාවලියේ දී භාවිත කරන උපකරණය ඇඳ නම් කරන්න.

(vi) $\mathbf{M_3}$ ක්‍රියාවලියේ දී භාවිත වන ලවණය හඳුනාගන්න.

(vii) $P_5$, $P_6$ සහ $P_9$ හි **එක්** ප්‍රයෝජනයක් බැගින් දෙන්න.

**(ලකුණු 75 යි)**

